# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

---

**[සහතිකය සටහන් කළේ 2026 සැප්තැම්බර් මස 25 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2026 සැප්තැම්බර් මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 20.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

[සහතිකය සටහන් කළේ 2026 සැප්තැම්බර් මස 25 වන දින]

එල්. ඩී.- ඕ. 24/2026

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ලෙස හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් ඒ ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

> "(5) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් විශ්‍රාම ගත යුතු වයස අවුරුදු හැට හත වන අතර, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් විශ්‍රාම ගත යුතු වයස අවුරුදු හැට පහ වන්නේ ය:
>
> එසේ වුව ද, අග්‍ර විනිශ්චයකාරවරයා විශ්‍රාම ගත යුතු දිනය ඔහු වයස අවුරුදු හැට හත සම්පූර්ණ කළ දිනය හෝ ඔහු අග්‍ර විනිශ්චයකාර ධුරයට පත් වන දිනයේ සිට වසර හයක කාලසීමාවක් සම්පූර්ණ වන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය වන්නේ ය:
>
> එසේ ම තවදුරටත්, පළමු අතුරු විධානයේ දක්වා ඇති අවුරුදු හයක කාලසීමාව, මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ දී අග්‍ර විනිශ්චයකාර ධුරය දරනු ලබන යම් තැනැත්තකුට අදාළ නොවිය යුතු ය.".

**3.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 137 වන ව්‍යවස්ථාවේ "දහනව දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් ද" යන වචන වෙනුවට "විසිහතර දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 137 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

PL 15907 - 768 (2026/08)

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැක.